# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2491/35 - 2026 ජුනි මස 03 වැනි බදාදා - 2026.06.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : ජා/2/2/1/පැ.පු.මාර්.15/2.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*අත්කර ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම් පත්තුව සුළු කොට්ඨාසයේ, 192/තුඩැල්ල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කණුවන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක 512201 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 1 හි පත්‍ර අංක 2 යටතේ පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0167 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල :

01. කැබලි අංක 1

ඉඩමේ නම: සෙක්කුවත්ත; විස්තරය:ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ තාවකාලික ගොඩනැගිලි 2 ක කොටස් ඇත. හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජා-ඇල කපුවත්ත කොළඹ පාරේ අංක 555 හි පදිංචි ඊ.ඒ.ඩී.මාලනී විනිෆ්‍රීඩා; ප්‍රමාණය: හෙක්. 0.0167.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.07.22 දින පෙ. ව. 10.00ට ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026.07.15 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එම්.නිලංගා ගුණවර්ධන,**
ප්‍රාදේශීය ලේකම් (*රා.ආ*),
ජා - ඇල.

2026 මැයි මස 27 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0009


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 462911 – 09 (2026/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*